ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය - 2014

-------------------------------------------------

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එලඹි අංක 2217 එස්.ආර්.අයි. දරන ණය ගිවිසුමේ උපලේඛණ 06 හි 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම, සහ ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව එවකට මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය දැනට මහාමාර්ග සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන වේ. ජාතික මහා මාර්ග ජාලය කාර්යක්ෂමව වැඩි දියුණු කිරීම සහ මාර්ග ආශ්‍රිත ආයතන ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණුවේ. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුලු පිරිවැය ඇ.එ.ජ ඩොලර් මිලියන 216 කට සමාන රු. මිලියන 23,760 වූ අතර ඉන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 150 කට සමාන රු. මිලියන 16,500 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. 2008 පෙබරවාරි 25 දින ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අවබෝධතා ගිවිසුමකට අත්සන් කර තිබුණු අතර ඒ අනුව ආරම්භක ණය මුදල ඇතුළත ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීමට ණය ගිවිසුම 2008 මැයි 27 දින සංශෝධනය කර තිබුණි. ඉහත තත්ත්වයට අමතරව, ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (ඛණිජ තෙල් අපනයනය කිරීමේ රටවල සංවිධානය) සමඟ අංක 1355 පී දරන වෙනත් ණය ගිවිසුමකට 2010 ඔක්තෝබර් මස 04 දින අත්සන් කර තිබුණු අතර ඇ.එ.ජ. ඩොලර් මිලියන කට සමාන රු. මිලියන 880 මූල්‍යනය කිරීමට ආර්ථික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝම්බර් 04 දින එළඹි අංක 2767 එස්.ආර්.අයි. දරන අතිරේක ණය ගිවිසුමක්ද අත්සන් කර ඇති අතර එකී ගිවිසුම අනුව ඇ.එ.ජ. ඩොලර් මිලියන 85 කට සමාන රු. මිලියන 9350 ක් වෙන් කරන ලදි. ඉහත පරිපූරක ණය ගිවිසුම අනුව වෙන් කිරීම් සඳහා 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වෙනමම ඉදිරිපත් කර ඇත. ආරම්භක ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කළ අතර 2012 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජයේ දායකත්වය ප්‍රයෝජනයට ගෙන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2014 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි. ආර්ථික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලේ මූල්‍ය කටයුතු 2015 ජුනි 30 දින අවසන් වනු ඇත. පරිපූරක ණය ගිවිසුම යටතේ කරගෙන ආ කාර්යයන් 2016 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ)	ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ)	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ)	මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ)	ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5	තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2.	මූල්‍ය ප්‍රකාශන

----------------

2.1	මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් දැක්වෙන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ)	2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ)	සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ)	ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ)	මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ)	ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

(අ) වැරදි ගණනය කිරීම් හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ක්ෂය වෙන් කිරීම් රු.169,312 කින් වැඩිපුර දක්වා තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

3.1.1 අරමුදල් භාවිතය

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දක්වා වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යායනය කිරීමට එකඟ වූ මුදල | | 2014 වර්ෂයේ අරමුදල් උපයෝජනය | | 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | ඇ. එ .ජ. ඩොලර් මිලියන | රු. මිලියන | ඇ. එ. ජ. ඩොලර් මිලියන | රු. මිලියන | ඇ. එ. ජ. ඩොලර් මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 150.00 | 16,500.00 | - | - | 150.00 | 17,272.20 |
| ඔපෙක් අරමුදල | 8.00 | 880.00 | - | - | 8.00 | 928.55 |
| ශ්‍රී ලංකා රජය | 58.00 | 6380.00 | 7.73 | 1,004.57 | 62.51 | 8,125.74 |
| | 216.00 | 23,760.00 | 7.73 | 1,004.57 | 220.51 | 26,326.49 |

3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව ජාතික මාර්ග 06 ක පුනරුත්ථාපන කටයුතු හා මහා මාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු කරගෙන යෑම ව්‍යාපෘතියේ අපේක්ෂාව විය. ලැබී ඇති තොරතුරු අනුව 2014 දෙසැම්බර් 31 දිනට සියළු මාර්ග පුනරුත්ථාපන කටයුතු නිමකර තිබුණි. කෙසේ වෙතත් ගොඩනැගිල්ලේ පියවර 3 ඉදිකිරීම් වැඩ 2014 ජුලි 30 දිනට නිම කිරීමට අපේක්ෂිත වුවත්, 2014 දෙසැම්බර් 31 දිනටත් නිම කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත්ත කටයුතු පාලනය

------------------------------------

2010 අගෝස්තු 17 දින මහා මාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රු. මිලියන 599.30 කට පුද්ගලික අංශයට ප්‍රදානය කර තිබුණු අතර, මහල් 08 කින් යුත් ගොඩනැගිල්ලේ පළමු මහල් 3 හි කටයුතු 2011 නොවැම්බර් 04 දිනට පෙර නිම කිරීමට අපේක්ෂා කෙරුණි. කෙසේ වෙතත් ගොඩනැගිල්ලේ වැඩ සියයට 90 නිමවන අවස්ථාවේදී පළමු කොන්ත්‍රාත්තුවට කරන ලද විචලනයන් ලෙස සලකා ගොඩනැගිල්ලේ ඉතිරි මහල් 05 හි ඉදිකිරීම් කටයුතු එම කොන්ත්‍රාත්කරුට අතිරේක රු. මිලියන 568.14 කට ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් 2011 දෙසැම්බර් ප්‍රදානය කරන ලද අතර තවදුරටත් , 2012 ජූනි ව්‍යාපෘති කළමණාකරණ ඒකකය ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 795.73 කට මෙම ගොඩනැගිල්ල මහල් 2 කින් වැඩි කිරීමට තිරණය කරන ලදි.ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට මහල් 10 කින් යුත් ගොඩනැගිල්ලේ අපේක්ෂිත වූ පිරිවැය රු.මිලියන 1963.17 විය. එම පළමු වන වෙනස සඳහා වැයවෙන අමතර පිරිවැය සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2013 ජූලි 11 දින ලබාගෙන තිබුණු අතර අතිරේක පිරිවැය දායකත්වය ශ්‍රී ලංකා රජය දරන ලදි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) 2013 පෙබරවාරි මාසය සඳහා වූ උපදේශකවරුන්ගේ ප්‍රගති වාර්තාව අනුව ගොඩනැගිල්ලේ මහල් 10 හි වැඩ සැලකිය යුතු තරමින් නිම කර තිබුණි. කෙසේ වෙතත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 සහ 8.13.4 ඡේද අනුව එම ගොඩනැගිල්ලේ මහල් සංඛ්‍යාව තවත් මහල් දෙකකින් වැඩි කිරීම සඳහා වූ විෂය පථය විචලනය සඳහාත්, ඒ සම්බන්ධයෙන් වැය වෙන පිරිවැය සහ ලබා දී තිබුණු කාලය දිර්ඝ කිරීම සඳහාත් තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව කරගෙනයෑම සඳහා කොන්ත්‍රාත්කරු ව්‍යාපෘති කළමණාකරණ ඒකකය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වී තිබුණු අතර ලිඛිත ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට අත්සන් කර නොතිබුණි.

(II) ඉදිකිරීම් වැඩවල විෂය පථය නිතර කෙරෙන වෙනස් කිරීම්වලට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙස, විචලන වැඩ සඳහා ඉහළ රේටයන් අදාල කර ගැනීමට කොන්ත්රාත්කරුවන්ට ඉඩහැර තිබුණි. මහල් 3 හි ඉදිකිරීම් වැඩ සඳහා 13% සිට 68% දක්වා පරාසයක විචලන වැඩ ඇස්තමේන්තු පිරිවැයට අතිරේකව සිදුකර ඇති බව සනාථ විය. සංශෝධිත වැඩ සටහන් යාවත්කාලීන කොට ඉදිරිපත් නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද දඩ තීරණය කිරීමට හා ආපසු අයකර ගැනීමට නොහැකි විය.

(III) ගොඩනැගිලි සැලසුමට අනුව ගොඩනැගිල්ල තුළ හෝ ඉන් පිටත මෝටර් රථ ගාල් කිරීම සඳහා ඉඩ පහසුකම් වෙන්කර නැති අතර ඒ සඳහා අතිරේක ස්ථාන සැපයීම අවශ්‍ය වී තිබුණි.

(IV) කොන්ත්‍රාත් ගිවිසුමේ අන්තර්ගත නිශ්චිත කොන්දේසි අනුව අතිරේක හෝ අමතර වැඩ සඳහා 15% ලාභ ආන්තිකයක් හිමිකම්පෑමට කොන්ත්‍රාත්කරුට ඉඩහැර තිබුණි. කෙසේ වෙතත් ඉහත කොන්දේසිවලට පටහැනිව 25% ලාභ ආන්තිකයක හිමිකම් පෑම්කර තිබුණු බවට නිදසුන් නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරුගේ 2012 නොවැම්බර් 17 දිනැති අංක

සී/369/10/එච්.එස්.බී - එච් ඕ/2013 ලිපිය අනුව මහල් 3 හි ඉදිකිරීම් වැඩ සඳහා එකඟ වූ ප්‍රමාණයට වඩා අතිරේක හිමිකම් පෑම් ඉදිරිපත් නොකිරීමට තවදුරටත් එකඟ වී තිබුණි. කෙසේ වෙතත් වැඩ බිමේ ඇති ද්‍රව්‍ය, ප්‍රවාහන ගාස්තු හා රඳවාගත් වැඩ සඳහා එකතු රු.මිලියන 6.14 හා අතිරේක හිමිකම් පෑම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(V) කොන්ත්‍රාත් ගිවිසුමේ වගන්ති 14.10 අනුව කොන්ත්‍රාත්තුව අවසානයේ ප්‍රමාණපත්වල සඳහන් වැඩ සියල්ල නිම කර ඇති බවට සනාථ කොට වැඩ නිම කිරීමේ සහතිකයක් කොත්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කිරීම අවශ්‍යය. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු රු.මිලියන 50.13 ක් වටිනා වැඩ නිමකළ බවට, වැඩ නිමකිරීමේ සහතිකයක් ඉදිරිපත්කර තිබුණද 2014 දෙසැම්බර් 31 දිනට වැඩ නිමකර නොතිබුණි.

3.4 මතභේදයට තුඩු දුන් කරුණු

-----------------------------------

ආරම්භයේදී මහා මාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ වැඩ සඳහා උපදේශකයෙකු පත් කර 2014 අගෝස්තු 31 දිනට රු.මිලියන 37.71 ක් එම නිළධාරීන්ට ගෙවා තිබුණි. කෙසේ වෙතත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර ගොඩනැගිල්ලේ මහල් 9 හි අභ්‍යන්තර නිර්මාණ වැඩ සඳහා රු. මිලියන 7.19 ඇස්තමේන්තු පිරිවැයකට වෙනත් උපදේශකයකු 2014 සැප්තැම්බර් 22 පත්කර තිබුණි.

3.5 මූල්‍ය පාලන කරුණු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා මාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ලෝහ සීලිමක් සැපයිම හා සවිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවට ඇතුළත් වූ කොන්ත්‍රාත්කරුට 2014 සැප්තැම්බර් විචලන නියෝගයක් යටතේ රු. මිලියන 32.25ක් ගෙවීම් කර තිබුණි. පසුව ඒ සඳහා රු. මිලියන 2.57ක් වැඩිපුර ගෙවා ඇති බව අනාවරණය විය. කොන්ත්‍රාත්කරුට අතිරේඛ මුල්‍ය ප්‍රතිලාභ ලැබීමට ඉඩහැර මෙම වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට 2014 දෙසැම්බර් ක්‍රියාකර තිබුණි. රු. මිලියන 8.14 වටිනා Horizontal cable tray සැපයීම හා සවි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු.මිලියන 11.63 ගෙවා තිබූ අතර, මේ සඳහා රු. මිලියන 3.49 වැඩිපුර ගෙවීමක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම වැඩිපුර ගෙවීමෙන් මාස 08 කට පසුව එනම් 2014 දෙසැම්බර් එම වැඩිපුර ගෙවීම ආපසු අයකර ගෙන තිබුණි.

(ආ) ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ රු.මිලියන 268.79 පිරිවැයට විදුලි උත්පාදන යන්ත්‍ර, වීදි ආලෝක පද්ධති, වායු සමීකරණ පද්ධති,elevators හා විවිධ උපාංග අයිතම් සැපයිමට හා සවිකිරීමට අනුමත කර තිබුණු අතර ඒවා ප්‍රධාන කොන්ත්‍රාත්තුවට විචලනයක් ලෙස සලකා කොන්ත්‍රාත්කරුට අතිරේක ප්‍රතිලාභ ලෙස සියයට 15 ලාභ හා පොදුකාර්ය ගාස්තු ඉපයීමට හා තවත් සියයට 15 සවිකිරීම් ගාස්තු ලෙස ලබා ගැනීමට ඉඩහැර තිබුණි.

3.6 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල 59 කින් සමන්විත වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 70 ක කාර්ය මණ්ඩලයකින් සමන්විත විය. කෙසේ වෙතත් ඇබෑර්තු 11 ක් සමුච්චිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කර නොතිබුණු අතර, එයට ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන් තිදෙනෙකු ඇතුළත්ව තිබුණි. උපදේශකවරු 08 ක් ලිපිකරුවන් 2 ක් හා පද්ධති විශ්ලේෂකයෙකු සේවයේ යොදවා සමාලෝචිත කාලයේදි ව්‍යාපෘතියෙන් රු.3,158,130 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණත් එම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර නොතිබුණි.

(ආ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 2.2.7 ජේදයට අනුව ව්‍යාපෘතියේ සියලු තනතුරු කොන්ත්‍රාත් පදනම මත උපරිම වර්ෂ 3 ක කාලයකට වූ අතර සෑහීමකට පත්වන කාර්ය සාධනයට යටත්ව වාර්ෂිකව පත්කිරීම් ද අලුත් කරනු ලැබේ. කෙසේ වෙතත් ඉහත අවශ්‍යතාවයට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 34 දෙනෙකු තාවකාලික පදනම මත ව්‍යාපෘති සේවයේ යොදවා තිබුණි.